**2021 ජුලි මස 20 වන දින පැවති**

**තිස් නව වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.07.20**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **16.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **17.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **18.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **20.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමී වීරකෝන් මිය

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2021.06.21 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.06.21 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.06.21 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 2021.06.21 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>සංශෝදන</u>**

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ගරු සභිකවරුන් හා මහ සභාව සඳහා ගෞරවයක් ලැබෙන ආකාරයට හොඳ ඇඳුමකින් සැරසී සිටීම සම්බන්ධයෙන් ලේකම්තුමා වෙත ස්තූති වන්ත වන බවත්, ලේකම්තුමා සභාවේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව සත්‍යා හා ජ්‍යේෂ්ඨත්වය අවබෝධ කර ගනිමින් යමක් කරාවි යන්න විශ්වාස කල බවත්, 2002 ප්‍රාදේශීය සභාවේ නියෝජය කල තමන් ආණ්ඩුපක්ෂය නියෝජනය කරනු ලබන සෑම මන්ත්‍රීවරයෙකුගේම නිවසකින් තේ උගුරක් හෝ පානය කර තිබෙන බවත්, සභාව ආරම්භයේදී තමා හට සිදු වූ කණස්සල්ල අද වන විට තවත් වැඩි වී ඇති බවටත්, ඒ කාලකන්නි ක්‍රමවේදය කවුරු කලත් එය දැඩි පිළකුලෙන් යුතුව හෙලා දකින බවත්, දෙවරක් සභාපතිධූරය දැරූ තමා 21 දෙනෙක් නියෝජනය කරන මහ සභාවේ 20 වන තැනට සභා වාර්තාව තුල ඇතුලත් කර තිබීම සම්බන්ධව තමන් කණගාටු වන බවත්, අද දින ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය නියෝජනය කරන නවක ගරු මන්ත්‍රීවරු දෙපල තමාට වඩා ජ්‍යෙෂ්ඨයින් බවට දක්වා තිබෙන බවත්, පාර්ලිමේන්තුවක, පළාත් සභාවක යන ඕනෑම ස්ථානයක ජ්‍යෙෂ්ඨත්වය කෙරේ අවධානය යොමු කරන නමුත් සභාවේ එසේ නොවීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වගකිව යුතු බවත්, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් කිසිදු ද්වේශයක් නොමැති මුත් දිනෙන් දින වන මෙම කාර්යය නතර කරන ලෙස ප්‍රකාශ කරමින් සිය කණගාටුව දක්වන ලදී.

තවද මෙම පළාත් පාලන ආයතනය සඳහා 2002 වර්ෂයේදී විපක්ෂ නායක ලෙස තනතුරක් නොමැති ලෙසට ප්‍රකාශ කිරීමේදී තමන් මහ සභාව තුල 3 වන අසුනේ අසුන්ගත් නමුත් සභාවෙන් පිටතදී තමන් විපක්ෂ නායක ලෙස කටයුතු කල බවත්, තමන් ගරු සභාපතිධූරය දැරීමේදී ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා විපක්ෂ නායක තනතුර ඉල්ලා සිටියත්, එහිදීද එම අවස්ථාව මහ සභාව තුල තමා ලබා නොදුන් නමුත් එතුමා සභාවෙන් පිට සමාජය තුල විපක්ෂ නායක ලෙස කටයුතු කල බවත්, වර්ථමාන මහ සභාව පිහිටුවීමෙන් පසුව ගරු සභාපතිතුමා විසින් විපක්ෂ නායක ධූරය ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා වෙත ලබා දීම තමාට රිදවීම සඳහා සිදු කල කාර්යයක් බවට තමන් විශ්වාස කරන බවත් සඳහන් කරන ලදී.

තවද ක්‍රීඩාව තුළින් සමාජයට වන යහපත හා නිරවුල් මනසක් සහිත පුද්ගලයකු බිහි කිරීම යන්න තමා කල ප්‍රකාශය ක්‍රීඩාව තුළින් සමාජයට වන යහපත් හා නිරවුල් මනසක් සහිත පිරිපුන් පුද්ගලයකු බිහි කිරීම ලෙසට සංශෝධනය විය යුතු බව ද සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> සිදු වී ඇති වරද පිළිගන්නා බව ප්‍රකාශ කරමින් ඉදිරියේදී ජ්‍යේෂ්ඨත්වය මත වාර්තාවේ පෙලගැස්ම නිවැරදි කරන බව සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.06.21 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01. නිවාඩු දැනුම් දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.ඒසංජීව මැතිතුමා, ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා, ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය හා ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී ඊ ගයාන් චාමර මැතිතුමා පෙ.ව 10.12 මහ සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා</u> පහළ වැව ප්‍රදේශයේ බෝක්කුවක් ඉදි කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇති ලිපිය කිහිපවරක් තමන් විසින් සභාවට ඉදිරිපත් කලත් එය සභා ගත කිරීමක් සිදු නොකිරීම සම්බන්ධව කණගාටු වන බව සඳහන් කරමින් මේ වන විට අදාල කාර්යය ඉටු කර ඇත්ද යන්න විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනිය</u> අදාල බෝක්කුව සකස් කර දෙන ලෙස ප්‍රදේශවාසීන් කර ඇති ඉල්ලීමට අනුව ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිළධාරීතුමා සමඟ ගොස් පරීක්ෂා කල අතර, එය සකස් කර දීමට අදාල බෝක්කුව පිහිටී මාර්ගයේ ඉදි කිරීම් කටයුතු කල කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇති බැවින් ඉදිරියේදී අදාල බෝක්කුව සකස් කරන බවට ප්‍රකාශ කරන ලදී.

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**01. බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා බෝක්කු ස්ථාපනය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අදාල බෝක්කු බට ස්ථාපිත කල ස්ථාන මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> සර්ජිකල් මාර්ක්ස් 5000 ක් ආධාර යටතේ ලැබුණු බවට මීට ඉහතදී සභාවට ඉදිරිපත් කර නොතිබූ නමුත් මීට ඉහත සභාවේදී තමන් වෙත ලැබුණු ලිපියක් තුල සර්ජිකල් මාර්ක්ස් 5000 ක් ලැබී එයින් 2500 ක් සභාපතිවරයා රැගෙන ගොස් ඇති බවට සඳහන් වී තිබූ නිසා තමන් ඒ බව දැනගත් බවත්, එලෙස මාර්ක්ස් 5000 ක් ලැබුණු බවට මහ සභාව දැනුවත් කර තිබුණානම් වඩාත් සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

තවද වැසිකිළි ආධාර ලබා දුන් පුද්ගලයින්ගේ නම් සඳහන් වාර්තාවක් හා 2020 වර්ෂය සඳහා වන විගණන වාර්තාව සභා ගත කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.07.09 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අළුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | විස්තරය | මිල දී ගන්නා ප්‍රමාණය | ඒකකයක මිල | | |
|---|---|---|---|---|---|
| | | | ශශී ඉලෙක්ට්‍රිකල්ස්,අංක 122, බැංකු පෙදෙස, අනුරාධපුර | මහජන හාඩ්වෙයාර්, අංක 90, මහ වීදිය, අනුරාධපුර | ලකී හාඩ්වෙයාර්, අංක 77, බැංකු පෙදෙස, අනුරාධපුර |
| 1 | තම්ලා ස්විච් | 100 | 165.00 | 175.00 | 185.00 |
| 02 | වයර් රෝල් 1044 | 10 | 2,225.00 | 2,400.00 | 2,350.00 |
| 03 | ටෙක්ස්ටර් | 03 | 150.00 | 175.00 | 185.00 |
| 04 | ටේප් රෝල් | 50 | 70.00 | 85.00 | 80.00 |
| 05 | හෝල්ඩර් | 200 | 80.00 | 85.00 | 90.00 |

ඉදිරිපත් කරන ලද මිල ගණන් අතරින් වීථි පහන් උපකරණ මිල දී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 122, බැංකු පෙදෙස, අනුරාධපුර ලිපිනයේ පිහිටි ශශී ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 58,700.00 යටතේ අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලොඩරය අළුත්වැඩියා කිරීම.**

ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩරය දැඩි ලෙස අබලන් තත්වයේ පැවතීම නිසා අළුත්වැඩියා කිරීම අවශ්‍ය වූ අතර ඒ සඳහා හදිසියේ මිල ගණන් කැඳවා ගරු සභාපතිතුමාගේ අනුමැතිය මත හුන්කෝ මෝටර්ස් ආයතනය මගින් අදාල අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා තීරණය කල අතර, ඊට අදාලව එම ආයතනයෙන් ඉදිරිපත් කල රු 285,000.00 ඇස්තමේන්තු ගත බිල්පත මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ අනුමැතියට යටත්ව අදාල බිල්පත ගෙවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -2021**

ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -2021 යටතේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල හා නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීමට නියමිත මාර්ග ලැයිස්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

| ව්‍යාපෘති අංකය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|
| LA/20/21/BP/124 | ශ්‍රාවස්තිපුර 259 | 4 ඇල සිට මල්වතු ඔයට යන මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/125 | ශ්‍රාවස්තිවත්ත 260 | රාජපක්ෂ මාවත | 2,000,000.00 |
| LA/20/21/BP/126 | කිඹුලාකඩ 262 | සුදර්ශන මාවත 4 වන පටුමඟ | 2,000,000.00 |
| LA/20/21/BP/127 | දිවුල් වැව 264 | පොඩි මැණිකේ මහත්මියගේ නිවස අසල සිට ආරියවතී මහත්මියගේ නිවස දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/128 | පාවක්කුලම 267 | ශ්‍රිමාලි මහත්මියගේ නිවස අසල සිට ශානක මහතාගේ කඩය පසුකර ඇති මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/129 | කළු ආරච්චියාගම 268 | ඩබ්. ජයසුන්දර , සරත් චන්ද්‍රසිරි යන මහත්වරුන්ගේ නිවාස දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/130 | පහළවැව 269 | චමින්ද මහතාගේ නිවස අසල සිට යෝධ ඇල දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/131 | තුරුවිල 270 | එන්.බී වීරසිංහ මහතාගේ නිවස අසල සිට යූ.බී පියසේන මහතාගේ නිවස දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/132 | හිදෝගම 271 | පිට්ටනියේ සිට කළුවිල සේන මහ විද්‍යාලයේ පිටුපස මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/133 | සුහදගම 272 | සුහදගම පාලමේ සිට වසන්ත මහතාගේ නිවස මංසන්දිය දක්වා | 2,000,000.00 |
| LA/20/21/BP/134 | මඩවලගම 273 | අතුරුවැල්ල කොන්ක්‍රීට් පාරේ සිට ඉදිරියට | 2,000,000.00 |
| LA/20/21/BP/135 | උතුරු කළුවිල 274 | 4 ඇල කොන්ක්‍රීට් පාරේ සිට ඉදිරියට | 2,000,000.00 |

නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

| ව්‍යාපෘති අංකය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|
| LA/20/21/BP/136 | සුචරිතගම 236 | 03 වන පටුමඟ ක්‍රීඩා පිටිය පාර සමෘද්ධි මාවත පාලම අසල මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/137 | මහ පාලාඩිකුලම 237 | 03 වන පටුමඟ කුට්ටි ගල් අතුරා ඉතිරි වූ කොටස | 2,000,000.00 |
| LA/20/21/BP/138 | ඥාණික්කුලම 238 | රත්නායක මාවතේ සිට අප්සරා මහත්මියගේ නිවස අසලින් පිහිටා ඇති අතුරු මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/139 | වන්නිතම්මැන්නාව කොටසක් 239 | පාලාඩිකුලම ප්‍රධාන මාර්ගයේ සිට කසුන් මහතාගේ නිවස දක්වා දිවෙන අතුරු මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/140 | තම්මැන්නාකුලම කොටසක් 240 | නව නුවර පාරේ සිට සුජිත් මහතාගේ නිවස දක්වා ගුවන් හමුදා කඳවුර අසලින් දිවෙන අතුරු මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/141 | තම්මැන්නාපුර 241 | වින් ගෘප් ආයතනයේ සිට යසසිරිගම හරහා යන අතුරු මාර්ගය | 2,000,000.00 |

| | | | |
|---|---|---|---|
| LA/20/21/BP/142 | වන්නියම්කුලම 01 242 | සාලිය මාවත, ධර්මපාල මාවත සිට පාසල් මාවත දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/143 | වන්නියම්කුලම 2 243 | ජේන් නෝනා මාවත කුට්ටිගල් අතුරා ඇති සිථානය සිට 9 ඇල මාවත දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/144 | වන්නියම්කුලම 03 244 | තිස්ස මාවත කුට්ටිගල් අතුරා ඇති ස්ථානයේ සිට පෙහෙකම් මාවත දක්වා | 2,000,000.00 |
| LA/20/21/BP/145 | අළුත්වැව 261 | මොරගොඩ වතුර ටැංකිය ඉදිරිපිට තුෂාර මහතාගේ නිවස දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/146 | ආමනේ 263 | ජීවක මහතාගේ නිවස අසල සිට 2 ඇල දක්වා මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/147 | කුඩා නෙළුබැව 265 | කුරුප්පු මහතාගේ නිවස අසල ඇති මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/148 | මහ නෙළුබැව 266 | 10 ඇල සෝමපාල මුදලාලිගේ නිවස අසල ඇති මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/149 | කවරක්කුලම 275 | විභූතිගම නාම පුවරුව අසල සිට | 2,000,000.00 |
| LA/20/21/BP/150 | කීරික්කුලම 276 | පන්සල පාර මුතු බංඩාගේ නිවස අසල සිට අතුරු මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/151 | කුඩා නෙළුම්කුලම 277 | කුඩා කලත්තැව වාහන සේවා ස්ථානය ඉදිරිපිට මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/152 | නෙළුම්කන්නිය 278 | ප්‍රධාන මාර්ගයේ සිට පන්සල දක්වා මාර්ගය | 2,000,000.00 |

අදාල ව්‍යාපෘතිය යටතේ එවා ඇති ව්‍යාපෘති බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## IV. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) 2021

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) 2021 යටතේ මෙම ප්‍රාදේශීය සභාව සඳහා අනුමත වී ඇති ව්‍යාපෘති මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | අනුමත මුදල (රු ) |
|---|---|---|
| NCP/C/09 | පෙරටු කාර්යාලයේ ඉහළ මාලය නවීකරණය කිරීම. | 995,113.25 |
| NCP/C/10 | බ්ලොක් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | 4,579,655.75 |
| **එකතුව** | | **5,574,765.00** |

අදාල ව්‍යාපෘති කඩිනමින් අවසන් කර අදාල බිල්පත් අවශ්‍ය නිර්දේශයන් සහිතව 2021.08.31 දිනට හෝ එදිනට පෙර පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කල යුතු වන බැවින් අදාල කොන්දේසි වලට යටත්ව බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානයක් මගින් ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමටත්, යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීමේදී අදාල ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීම සුදුසු බවටත්, මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## V. ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොක් ගල් වැඩපල සඳහා අවශ්‍ය සිමෙන්ති මිල දී ගැනීම.

ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොක් ගල් වැඩපල සඳහා අවශ්‍ය සිමෙන්ති මිල දී ගැනීම වෙනුවෙන් 2021 අප්‍රේල් මස කැඳවන ලද මිල ගණන් 2021.04.15 වන දින මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව එහි අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නන්දන රොඩ්‍රිගෝ කන්ස්ට්‍රක්ෂන් වෙතින් සිමෙන්ති මිල දී ගැනීමට තීරණය වූවත්, මේ වන විට එම මිල රු 930.00 සිට රු 950.00 දක්වා වැඩි වී ඇති බවට දන්වා ඇත.

එම ඉදිරිපත් කල මිලද අනෙක් ආයතන වලින් ඉදිරිපත් කල මිල ට වඩා අවම මට්ටමේ පවතින බැවින්, එම කැඳවන ලද මිල ගණන් වලට අනුව සිමෙන්ති කොට්ට 50 ක ප්‍රමාණයක් සම්පූර්ණ වටිනාකම රු 47,500.00 කට නන්දන රොඩ්‍රිගෝ කන්ස්ට්‍රක්ෂන් වෙතින් මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## VI. වායු සමීකරණ මිල දී ගැනීම.

ප්‍රාදේශීය සභාවේ පෙරටු කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටු නිර්දේශ මත මහ සභා අනුමැතියෙන් ඉංජිනේරු මහතා වෙත යොමු කල අතර එතුමාගේ නිර්දේශය අනුව Singer plus ආයතනය මගින් රු 90,599.00 වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමට තීරණය වූ නමුත් මිල දී ගැනීමට යන අවස්ථාවේදී එම වටිනාකම රු 98,999.00 දක්වා වැඩි වී ඇති බවට අදාල ආයතනය මගින් දැනුවත් කර ඇත.

පවතින තත්වය හමුවේ නැවත මිල ගණන් කැඳවීම ප්‍රායෝගික නොවන බැවින්, වැඩි වුණු මිල ගණන් සමඟ සම්පූර්ණ වටිනාකම රු 98,999.00 පෙරටු කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර Singer plus ආයතනය මගින් මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ ඉදිරිපත් කල ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනස් ලෙසින් දක්වා තිබෙන මුත් එය නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

තවද එම ව්‍යාපෘති තුල කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇල්ලීමට නියමිත බැවින් ඒ තුල දැනට මාර්ග වල පවතින පළල ප්‍රමාණය අඩු වන ලෙසට ඉදි කිරීම් කටයුතු සිදු නොකරන ලෙස ප්‍රකාශ කරන ලදී.

4 ඇල සිට මල්වතු ඔයට යන මාර්ගය තුලින් අක්කර සිය ගණනක කුඹුරු වලට යන ජනතාව , බෝග පැටවූ ට්‍රැක්ටර් රථ හා ලොරි රථ ගමන් කරන බැවින් එම මාර්ගය අඩි 16 ක පළලින් යුතුවත් සෑම ව්‍යාපෘතියකම හඳුනාගත් විශේෂ ස්ථාන සඳහා අවශ්‍ය පළල සුදුසු පරිදි සකස් කරන ලෙසත් එසේ සිදු කල නොහැකි නම් ඒ සඳහා පළාත් ඉංජිනේරු වරයාගෙන් හෝ අවසරයක් ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද ගරු ආණ්ඩුපක්ෂය කොන්ත්‍රාත් සිදු නොකරන සේම ස්වෙච්ඡා සංවිධාන හරහා කොන්ත්‍රාත් කිරීමට සාධනීය මැදිහත්වීමක් සිදු කරන බැවින් හා ප්‍රාදේශීය සභාව තුල පක්ෂ විපක්ෂ භේදයක් නොමැති බැවින් මේ වන විට අනුමත වී ඇති ව්‍යාපෘති 34 තුල ආණ්ඩුපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ව්‍යාපෘති 2 බැගින් 22 ක් අධ්‍යයනය කිරීම සඳහා ලබා දී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහා ව්‍යාපෘතිය බැගින් ව්‍යාපෘති 10 ක් අධ්‍යානය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරමින් ගරු සභිකවරුන් 21 දෙනාම සහභාගී කරවා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලෙස වැඩි දුරටත් සඳහන් කරන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම බල ප්‍රදේශයට අයත් ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමාගේ කොට්ඨාශය තුල 5 ඇල තිඹිරිකඩවල මාර්ගයේ ගරු සභාපතිතුමාගේ ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමාගේ හෝ සහභාගීත්වයෙන් තොරව ම.නු.ප ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා රාජ්‍ය අමාත්‍ය චන්න ජයසුමන මැතිතුමා එක්ව ම.නු.ප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරියක සමඟ පැමිණ සමරු පළකයක් මෙම බල ප්‍රදේශයේ ඉහත මාර්ගය ඉදි කිරීම සඳහා මුල් ගල තබා ගොස් ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා දැනුවත් නොමැති වීම ඉතාම කේදනීය තත්වයක් වුවත්, බල ප්‍රදේශයේ

දියුණුව සඳහා කල මුල් ගල් තැබීමක් නිසා අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉඩ දී දියුණුවට මඟ සලසන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද මුදල් කමිටු වාර්තාව තුල සඳහන් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා රු 4,579,655.75 මුදලක් වෙන් කර ඇති බවට සඳහන් වීම තුල කුමක් අදහස් කරන්නේද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ග්‍රාමීය මාර්ග සංවර්ධනය -2021 යටතේ වන ව්‍යාපෘති පළාත් පාලන අමාත්‍යාංශය මගින් යොමු කර ඇති පරිදි මුදල් කමිටු වාර්තාව තුල ඇතුලත් කර තිබෙන බවත්, එය නිවැරදි ලෙස ක්‍රියාත්මක කරන බවත්, ප්‍රකාශ කරන ලද අතර බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා රු 4,579,655.75 මුදලක් වෙන් කර ඇත්තේ, නව බ්ලොග් ගල් නිෂ්පාදනය මධ්‍යස්ථානයක ස්ථාපිත කිරීම වෙනුවෙන් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා හා නව බ්ලොග් ගල් නිශ්පාදන යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මේ සඳහා ස්ථානයක් පවතින්නේද යන්නත්, ව්‍යාපෘතියට අදාලව ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඇත්ද යන්නත්, ඒ කිසිවක් සභාවට ඇතුලත් නොකර මෙසේ අනුමත මුදලක් සභා ගත කරන්නේ මන්ද යන්නත් අදාල ස්ථානය හෝ සඳහන් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මේ සඳහා මුදල පමණක් අනුමත වී පවතින බවත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නෙළුබෑව පන්සල ඉදිරිපිට පොල භූමිය යොදා ගැනීමේ අපේක්ෂාවෙන් සිටියා වූවත්, මේ වන විට රජය මැදිහත් වී පවතින පොහොර ගැටළුවට විසඳුමක් ලෙස පොහොර නිශ්පාදනය කිරීම සඳහා එම ස්ථානය ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් හා ගරු අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා ඉල්ලීම් කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා සමඟ තමන් කල සාකච්ඡාවේදී අදාල පොල භූමිය වෙනුවට වෙනත් භූමියක් ලබා දෙන බවට අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කල බවත්,නමුත් තවමත් මෙම ස්ථානය සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹී නොමැති බවත්, එසේ වූවත් අමාත්‍යවරයා විසින් ලබා දෙන භූමිය හොඳද නැද්ද යන්න පරීක්ෂා කර බලා සේවකයින් කොපමණ බඳවා ගන්නේද යන්න සොයා බලා ඒ සම්බන්ධයෙන් වන වාර්තාවක් සභාවට ඉදිරිපත් කර අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කරන ලදී.

තවද ඉටු කිරීමට නියමිත සෑම ව්‍යාපෘතියක්ම බල ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කරන බැවින් සභාවේ සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ හැකියාව පවතින බවත්, ඒ සඳහා කිසිදු බාධාවක් නොමැති බව සඳහන් කරන ලදී.

අනතුරුව නැවතත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් වලට අනුව මිලදී ගැනීමට යන අවස්ථාවේදී එහි සිදු වූ මිල පරාසයන් සභාවක් ලෙස පිළිගෙන වැඩි මිලට මිල දී ගැනීමේ හැකියාව පවතින්නේද යන්නත්, මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සඳහන් කර ඇති කාලය තුල වෙළඳපලේ මිල ගණන් වෙනස් වූවත්, ඉදිරිපත් කර තිබූ මිල ගණන් වලට ලබා දීමට බැඳී සිටින බවත්, එසේ නොමැතිව මුදල් කමිටු තීරණයක් ලබා ගෙන එම වැඩි වූ මිලට මිල දී ගැනීමේ හැකියාවක් නොමැති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> අදාල ආයතනය මිල ගණන් වෙනස් වූ බවට ලිඛිතව දන්වා ඇත්ද යන්නත්, අදාල ලිපිය පදනම් කරගෙන මෙම තීරණය ලබා ගන්නේද යන්නත් විමසන ලද අතර අදාල නීතිමය තත්වය සලකා සුදුසු ක්‍රමවේදය අනුගමනය කරන ලෙසත්, මාර්ග සංවර්ධනයේදී, ඇතැම් මාර්ග කුට්ටි ගල් ඇතිරීම සිදු කල යුතුද යන්න විමසන ලද අතර කුට්ටි ගල් ඇතිරූ මාර්ග බොහෝමයක විවිධ ස්ථාන වලින් ගිලා බැස ඇති බවත්, කොන්ක්‍රීට් මාර්ග වලට වඩා වැඩි පැමිණිලි සංඛ්‍යාවක් කුට්ටි ගල් ඇතිරූ මාර්ග සඳහා ලැබෙන බවත්, ගැටළුව ලෙස පවතින්නේ ඇතැම් ප්‍රදේශ වල මාර්ග බොරළු ඇතිරුවද ගිලා බසින තත්වයක් පවතින බැවින් එවැනි මාර්ග සඳහා නිවැරදි පරීක්ෂාවක් සිදු කරන්නේ නම් සුදුසු බවත්, රාජපක්ෂ මාවතද එවැනි මාර්ගයක් බවත්, මෙහි විශාල ප්‍රමාණයේ වාහන ගමන් ගන්නා බවත්, කොඩිගල මාර්ගයද කාපට් අතුරන බවට සඳහන් කලත් එයද මෙතෙක් පිළිසකර කර නොමැති බැවින් එවැනි මාර්ග වල ප්‍රායෝගිකව සලකා බලා සුදුසු

මාධ්‍යයකින් මාර්ගය සකස් කිරීමට කටයුතු කල යුතු බවට ප්‍රකාශ කරන ලද අතර මාර්ගයේ පළල ප්‍රමාණය අඩි 12 ක් ලෙස ගරු සභාපතිතුමා සඳහන් කලද එම යෝජනා සම්මත කරනු ලැබූ අවස්ථාවේදී එය පළල මීටර් 3 ලෙසට දැක්වූ බවත්, මෙම මාර්ග තුල පවතින පළල මාර්ග ඉදි කිරීමෙන් පසු කුඩා වන බැවයින් මේ සඳහා විශේෂ අනුමැතියක් හෝ රැගෙන දිග ප්‍රමාණය අඩු වුවත්, නිවැරදි පළලින් යුතුවම පමණක් මාර්ග ප්‍රතිසංස්කරණය සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද මෙම ව්‍යාපෘතිය හොඳ ව්‍යාපෘතියක් වන සේම මේ තුල විශාල ජනතාවක් ගමන් ගන්නා සංවර්ධනය කල යුතු මාර්ග ඇතුලත් නොවී පවුල් 05 ක් පමණක් ගමන් ගන්නා මාර්ග ඇතුලත් කර ඇති බවද සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා මේ වන විට කාබනික පොහොර නිෂ්පාදනය වෙනුවෙන් සභාව තුල විධිමත් පියවරක් මෙතෙක් ලබා ගෙන නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු බවත්, බ්ලොග් ගල් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මුදල් කමිටුව තුල ව්‍යාපෘතිය අනුමත වී ඇතත්, ඊට අදාල ව්‍යපෘති වාර්තාවක් හෝ ඉදි කිරීමට අදාල යෝජනාවක් හෝ සභාවට ඉදිරිපත් වී නොමැති බවත්,සිදු කරනු ලබන මෙම කාර්යයන් හොඳ යහපත් වූ බැවින් ඒවායෙහි අඩු පාඩුවක් නොසිටින සේ අදාල පියවරයන් නිවැරදිව සිදු කරන ලෙසත්, දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> දැනට ක්‍රියාත්මක වන බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය හොඳ වැඩක් වන බැවින් මෙය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපාදන මුදලක් ලබා දෙන ලෙසට අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් සිදු කල බවත්, අදාල ඉල්ලීමට මෙම ප්‍රතිපාදන හිමි වී ඇති බවත්, ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් හෝ මෙතෙක් සකස් කර නොමැති බවත්, ඉල්ලුම් කල ඉල්ලීම මේ වන විට අනුමත කර ඇති බැවින් එය මේ අයුරින් සභා ගත කරන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> නිදන්ගල මාර්ගයේ ප්‍රාදේශීය සභාවෙන් ඉදි කල කොටස සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නොමැති බවත්, සභාවේ අනුමැතියකින් තොරව ජාතික ගොඩනැගිලි අමාත්‍යාංශය හරහා වෙනත් පුද්ගලයෙකු මාර්ගයෙන් කොන්ත්‍රාත් කල කොටස මේ වන විට කැඩී ගොස් පරිහානියට පත් වී ඇති බවත්, කුට්ටි ගල් ඇතිරීමේදී මූලික අඩිතාලම නිවැරදිව දමා සිදු කල ව්‍යාපෘති වල කිසිදු අවස්ථාවක මාර්ගය බැසීම සිදු නොවූ බවත්, යම් තැනක පොළව බැසීම සිදු වූවද එම ස්ථානයේ ගල ඉවත් කර නිවැරදිව තැලීම සිදු කරනැවත අදාල ගල් ස්ථාන ගත කිරීම සිදු කල හැකි බව සඳහන් කරන ලද අතර එය කොන්ක්‍රීට් අතුරනවාට වඩා ඵලදායී වන බවත්, මාර්ගයේ පළල නිවැරදිව තිබිය යුතුම වන බවත්, එසේ නොමැතිව ඉදි කිරීම තුල මාර්ගය දෙපස සිටින්නන් මාර්ගයට අයත් සීමාව අත්පත් කර ගැනීම පවා සිදු කරන බවත්, බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානයේ ලාභ අලාභ ගිණුම සකස් කර එය සභා ගත කිරීමට කටයතු කරන ලෙසත්, සේවා ස්ථානය සම්බන්ධයෙන්ද ලාභ අලාභ ගිණුමක් ලබා දීමට කටයුතු කරන ලෙසත්, ඒ මගින් ගරු මන්ත්‍රී කුමුදු මැතිතුමා විමසූ ගැටළුවට විසඳුම් ලැබෙන බවත්, යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා ව්‍යාපෘති වර්තාවක් සකස් කර සභා ගත කර තිබුනානම් එය ඵලදායී ද නැද්ද යන්න පිළිබඳ ගරු මන්ත්‍රීවරුන්ටද අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතින බවත්, මුදල් ලැබීමෙන් පසුව අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ස්ථානයක් හෝ සොයා ගැනීම සිදු කර නැතිනම් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් මතු වන බව සඳහන් කරන ලදී. තවද කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයද ගරු සභාපතිතුමා ඉතාම සත්භාවයෙන් ආරම්භ කල ව්‍යාපෘතියක් වුවත්, දිනෙන් දින අදාල ව්‍යාපෘතියේ ආදායම හෝ වියදම සම්බන්ධයෙන් කිසිවක් සභා ගත නොකර සභාවෙන් සභාවට ප්‍රතිපාදන වෙන් කර සංවර්ධන කටයුතු සිදු කල බවත්, මේ සම්බන්ධයෙන් ද ගැටළුවක් පවතින බැවින් වාහන සේවා ස්ථානයේ. බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානයේ හා කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ ආදායම් වියදම් වාර්තාවක් එළඹෙන මහ සභාවේදී ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

තවද 2006 වර්ෂයේ සභාව නියෝජනය කිරීමේදී මහජනතාව පාරට බොරළු අතුරා දෙන ලෙසට ඉල්ලීම් කලත්, අනතුරුව කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති ආර්ම්භ වූ පසු මාර්ගයට කොන්ක්‍රීට් අතුරා දෙන ලෙසටත්, කුට්ටි ගල් පැමිණි පසු කුට්ටි ගල් අතුරා දෙන ලෙසටත් ජනතාව ඉල්ලීම් කල බවත්, වර්ථමානය වන විට කාපට් මාර්ග ඉදි කර දෙන ලෙසට ඉල්ලීම් සිදු කරන බවත්, කුට්ටි ගල් ඇතිරීම සඳහා වන ව්‍යාපෘති තුල යම් අසාර්තකත්වයක් සිදු වනවා නම් ඒ සම්බන්ධයෙන් අදාල අධීක්ෂණ නිළධාරීයා වගකිව යුතුම වන බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> මාර්ග සංවර්ධනයේදී ප්‍රායෝගිකව අදාල මාර්ග බසින බවට වැටහීමක් තිබෙනවානම් එයට පැති බැම්ම හෝ සකස් කර ලැබී ඇති රු 2,000,000 ප්‍රතිපාදනය වඩාත් සුදුසු පරිදී ප්‍රදේශවාසීන්ගෙන් හෝ විමසා බලා තාක්ෂණ නිළධාරී මහතාගේ පරීක්ෂාවකින් පසුව ගැලපෙන විදියේ ක්‍රමවත් කිරීමක් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේදී මාර්ග සඳහා කොන්ක්‍රීට් ඇතිරීම සිදු කල යුතු නම් ඒ සඳහා රෙඩිමික්ස් භාවිතා කිරීමටත්, කුට්ටි ගල් ඇතිරීම සිදු කරන්නේ නම් ABC අතුරා මුලික අඩිතාලම යොදන ලෙසටත් උපදෙස් ලබා දී තිබෙන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> 2021.07.09 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේ ද යන්න විමසන ලදී. ඒ අනුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 ජූලි මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02. 2021 අගෝස්තු මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021 අගෝස්තු මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>**2021 අගෝස්තු**</u>

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. එස්.පී.එම් පුෂ්පකුමාරී මිය | (පුස්තකාල සහයක) | 40 |
| 05. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ඩී.පී.ඩී.එන්.එල් විජේසිරි මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |

| | | |
|---|---|---|
| 13. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 60 |
| 14. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 15. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය 2021 අගෝස්තු මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 අගෝස්තු මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා හා ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා පෙ.ව 11.00 සභා ගර්භයෙන් පිටව යන ලදී.

**03. බැකෝ ලෝඩරය සඳහා ගෙවූ මුදල් එම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මහ පාලාඩිකුලම, අනුරාධපුර ලිපිනයේ පදිංචි එස්.පී.ඩී.ජී වික්‍රමරත්න යන අය විසින් 2021.01.22 වන දින 2816 දරණ ලදුපත් අංකයෙන් බැකෝ ලෝඩරයේ සේවාව ලබා ගැනීම වෙනුවන් රු 3,300 ක් ගෙවීම් කර ඇතත් බැකෝ ලෝඩරය අළුත්වැඩියා කල යුතු තත්වයේ පැවති බැවින් එම කාර්යය ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් එම මුදල වන රු 3300 නැවත ඉල්ලීම් කර ඇති බව සඳහන් කර ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍රය සභා ගත කරන ලද අතර එම ගාස්තු නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල කාර්යය ඉටු නොකිරීම ප්‍රාදේශීය සභාවේ අඩුපාඩුවක් වන හෙයින් අදාල මුදල නැවත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල මුදල මහ පාලාඩිකුලම, අනුරාධපුර ලිපිනයේ පදිංචි එස්.පී.ඩී.ජී වික්‍රමරත්න යන අයට නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04. 2022 වර්ෂය සඳහා අයවැය කාල සටහන අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂයේ අයවැය වාර්තාව සකස් කිරීම සඳහා වූ කාල සටහන මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කල කාල සටහන අනුව 2022 වර්ෂයේ අයවැය වාර්තාව සකස් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | කාරණය | අවසාන ඉලක්ක දිනය | වගකිව යුතු අය |
|---|---|---|---|
| 01. | අයවැය ලේඛනය සකස් කිරීම සඳහා උපදෙස් ලේඛන නිකුත් කිරීම | ජූලි 19 | ප්‍රාදේශීය සභා ලේකම් |
| 02. | යෝජිත කොට්ඨාශ කමිටු හා සභිකවරුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම | ජූලි 30 | කොට්ඨාශ කමිටු සහ සභිකවරුන් |
| 03. | ආදායම් හා වියදම් පිළිබඳව ඒ ඒ අංශ වල වාර්ථා ඉදිරිපත් කිරීම | සැප්තැම්බර් 30 | විෂය ලිපිකරු |
| 04. | මූලික ඇස්තමේන්තු සකස් කිරීම | ඔක්තෝබර් 05 | අයවැය නිලධාරි |
| 05. | මුදල් කමිටුවේ උපදෙස් ලබා ගැනීම | ඔක්තෝබර් 08 | ප්‍රාදේශීය සභා ලේකම් |
| 06. | සභාපති සමාලෝචනය | ඔක්තෝබර් 15 | ප්‍රාදේශීය සභා සභාපති |
| 07 | අයවැය ප්‍රතිපත්ති තීරණය කිරීම සහ සභාවට ඉදිරිපත් කිරීම | ඔක්තෝබර් 22 | ප්‍රාදේශීය සභා සභාපති |
| 08 | අංශ වල අයවැය ඇස්තමේන්තු සකස් කිරීම | ඔක්තෝබර් 24 | විෂය ලිපිකරු |
| 09 | අවසාන ඇස්තමේන්තු සකස් කිරීම සහ අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම | ඔක්තෝබර් 31 | අයවැය නිලධාරි |
| 10 | මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් කෙටුම්පත් අයවැය ලේඛනය සලකා බැලීම | නොවැම්බර් 05 | ප්‍රාදේශීය සභා ලේකම් |
| 11 | අයවැය පණිවුඩ සැකසීම | නොවැම්බර් 19 | ප්‍රාදේශීය සභා සභාපති |
| 12 | කෙටුම්පත් අයවැය ලේඛනය සැකසීම | නොවැම්බර් 30 | ප්‍රාදේශීය සභා සභාපති |
| 13 | අයවැය ලේඛන කෙටුම්පත පළමු වර කියවීම. | දෙසැම්බර් 07 | සභාව |
| 14 | අවශ්‍ය වන්නේ නම් කෙටුම්පත් අයවැය ලේඛනය දෙවන වර කියවා සංශෝධන සහිතව අනුමත කිරීම. | දෙසැම්බර් 21 | ප්‍රාදේශීය සභා සභාපති |
| 15 | අයවැය ලේඛනය මුද්‍රණය කිරීම | දෙසැම්බර් 25 | ප්‍රාදේශීය සභා ලේකම් |

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල කාල සටහන අනුව 2022 වර්ෂය සඳහා අයවැය වාර්තාව සකස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්ඳුලසේන මැතිතුමා 2022 අයවැය සකස් කිරීමට ප්‍රථම ලේකම්තුමා වෙත 2020 අවසන් ගිණුම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අවශ්‍ය වන බවත්, එම ලේඛන කිසිවක් මෙතෙක් සභාවට ඉදිරිපත් කර නොමැති බවත්, අබලි භාණ්ඩ වෙන්දේසියද මෙතෙක් සිදු කර නොමැති බවත්, එම ලේඛන නොමැතිව අයවැය සකස් කිරීම සිදු කල නොහැකි බවත්, සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 අයවැය කාල සටහන සම්බන්ධයෙන් වූ යෝජනාවට යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් කල කාල සටහන අනුව 2022 වර්ෂය සඳහා අයවැය වාර්තාව සකස් කිරීමට සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05. අබලන්ව පවතින නළ ළිඳ පෞද්ගලික පරිහරණය සඳහා ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2 වන පටුමඟ, මිහිඳු මාවත, කලත්තෑව ලිපිනයේ පිහිටි නළ ළිඳ දැනට වසර ගණනාවක් කිසිදු පුද්ගලයෙකු පරිහරණය නොකරන අතර ආර්.එම් ප්‍රේමචන්ද්‍ර හා ඩබ් බන්දුපාල යන අයවළුන් දෙදෙනා ගෙවත්තේ ගොවිතැන් කටයුතු සඳහා පාවිච්චි කිරීමට මෝටරයක් දමා සකසා ගැනීමට අවශ්‍ය බව සඳහන් කරමින් ඒ සඳහා අවශ්‍ය අවසරය ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරමින් නළ ළඳට මෝටරයක් සවි කර අදාල ගෙවතු වගාවන් සඳහා යොදා ගැනීමටත් බාහිර

පාර්ශවයන්ට ජලය ලබා ගත හැකි වන පරිදී ජල කරාමයක් සවි කිරීමට උපදෙස් දීමත් සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2 වන පටුමඟ, මිහිඳු මාවත, කලත්තෑව ලිපිනයේ පිහිටි නළ ළිඳ පෞද්ගලික පරිහරණය සඳහා ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. අප ජලය කළමණාකරණය සම්බන්ධ පුහුණු වැඩ සටහන පැවැත්වීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා Zoom තාක්ෂණය ඔස්සේ Fetch Consultants ආයතනය විසින් එක් පුද්ගලයෙකුට රු 5,000 ක මුදලක් අය කරමින් 2021.07.29 වන දින පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා කාලය තුල පැවැත්වීමට නියමිත අප ජලය කළමණාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහනට මුදල් ගෙවා සහභාගී වීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා අදාල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල පුහුණු වැඩසටහනට රු 5000 ක මුදල ගෙවා Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකවම සභා සම්මත විය.

**07. ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා මාර්ගයේ කාණු කපා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා තරියන්කුලම, කුරුන්දන් කුලම, අනුරාධපුර ලිපිනයේ පදිංචි පී ඇන්ටන් ජයකොඩි යන අය විසින් 280 ග්‍රාම සේවා තුලානේ තරියන්කුලම පදිංචි තමා ඇතුළු පවුල් 06 ක පිරිසට මේ වන විට පානීය ජලය නොමැතිව ඉතා දුෂ්කරව ජීවත් වීමට සිදු වී ඇති බවටත්, අවශ්‍යතාවය සඳහා ජලය ගෙන ඒමට කි.මී 1 පමණ දුරක් යාමට සිදු වී ඇති බවත්, දැනට ජලය සිය නිවසට මීටර් 300 ක් පමණ දුරින් නතර කර ඇති අතර කිහිපවිටක්ම මිහින්තලය ජල සම්පාදන මණ්ඩලයට ලිපි යොමු කලද කිසිදු ප්‍රතිපලයක් නොවූ බැවින් අදාල මාර්ගයේ කාණුව කපා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරමින් අදාල මාර්ගයේ ජල සම්බන්ධතාවය ලබා දීම වෙනුවෙන් කාණුව කපා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා 2002 වර්ෂයේදී තුරුවිල සමූහ නගර ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී බල ප්‍රදේශයේ යම් යම් ගම්මාන හා කොට්ඨාශ ජල සම්බන්ධතාවය ලබා ගත නොහැකිව ඉතුරු වූ බවත්, එම අවස්ථාවේදී ග්‍රාමීය ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූවද ජල සම්පාදන මණ්ඩලය මගින් සිදු කරන පිරිසිදු කිරීම් එම ව්‍යාපෘති මගින් සිදු නොවූ බැවින් ජනතාව ජල සම්පාදන මණ්ඩලය මැදිහත් වී ලබා දෙන ජලය 100% හොඳ බවට විශ්වාස කල බවත් සඳහන් කරමින් ඒ සඳහා ප්‍රමාණවත් ජලය නොතිබීම හේතුවක් වූ සේම මේ වන විට රාජාංගනය ජල ව්‍යාපෘතිය මගින් බල ප්‍රදේශයේ ජනතාවට ලබා දිය නොහැකි වූ ගම්මාන සඳහා අවශ්‍ය ජල ධාරිතාවය හිමි කරගෙන ඇති බැවින් බල ප්‍රදේශයේ ජලය නොමැතිව හුදෙකලා වූ ගම්මාන හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය ජල අවශ්‍යතාවය සැපයීම සඳහා ප්‍රාදේශීය සභාවක් ලෙස සාධනීය මැදිහත්වීමක් ජල සම්පාදන අමාත්‍යවරයා සමඟ සිදු කරන ලෙස දීර්ඝ ලෙස කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා පෙ.ව 11.15 සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u>, තුරුවිල ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දක්වන ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා පිළිබඳ කණගාටු වන බව ප්‍රකාශ කරමින් කේ.බී රත්නායක මැතිතුමා තුරුවිල ජල ව්‍යාපෘතිය ආරම්භ කරන විට එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ එයට විරුද්ධව විශාල අරගලයක් සිදු කල බවත්, ලෙස කරුණු දැක්වීමේදී සිදු වූ ඝෝෂාකාරී තත්වය හමුවේ සිදු කල ප්‍රකාශ කිසිවක් පැහැදිළි නොවිණි.

අනතුරුව අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය තුරුවිල ජල ව්‍යාපෘතිය ආරම්භය සම්බන්ධයෙන් හොදින්ම දන්නේ ගම් වාසීන් වන බවත්, එවකට සිටි ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය තුරුවිල ක්‍රිඩා පිටියේ උත්සවයක් පවත්වා කේ.බී රත්නායක මැතිතමා ප්‍රමුඛව එච්.බී සේමසිංහ මැතිතුමාගේ ද සහභාගීත්වයෙන් රූස්වීමක් පැවැත්වූ බවත්, ඒ අතරතුර එම ව්‍යාපෘතිය හොඳ නැති බවට ප්‍රකාශයක් පතුරවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට උත්සහ දැරීමේදී ගම්මානයේ පදිංචි පුද්ගලයින්ගෙන් රු 100 බැගින් අය කර ගනිමින් ව්‍යාපෘතිය අත්පත් කර ගැනීම සඳහා නඩු මාර්ගයට ගිය බවත් යන්න ලෙස කරුණු දැක්වීමේදී ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා බාධා කිරීම් හමුවේ නැගී සිටි ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා තුරුවිල ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දැක්වීම සිදු කරන ලදී.

ඒ අනුව එතුමා විසින් තුරුවිල ජල ව්‍යාපෘතිය ප්‍රංශ ආධාර යටතේ එවකට අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට හා කතානායක කේ.බී රත්නායක මැතිතුමාට පින් සිදු වන්නට මේ බිමට ගෙන ඒමට හැකි වූ බවත්, තුරුවිල ගමේ ගම් වාසීන් රු 100 බැගින් එකතු කර නඩු කියූ නමුත් ඒ හේතුව නිසාම ජල සම්බන්ධතාවයන් ලබා ගැනිමට නොහැකි වූ බවත්. ඒ හේතුවෙන් තුරුවිල පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේ තුරුවිල වැවේදී සිවුරට ගිනි තබා ගැනීමට පවා උත්සහ දැරූ බවත්, අනතුරුව ගම්මානයට නොමිලේ ජල සම්බන්ධතාවය හිමි වූ බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනිය</u> තරියන්කුලම, කුරුන්දන් කුලම, අනුරාධපුර ලිපිනයේ පදිංචි පවුල් 06 සඳහා ජල සම්බන්ධතාවය ලබා දීම වෙනුවෙන් මීටර් 300 දුර මාර්ගයේ කාණු කපා දීම සුදුසු බවට ගරු සභපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් ලබා යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් තරියන්කුලම, කුරුන්දන් කුලම, අනුරාධපුර ලිපිනයේ පදිංචි පවුල් 06 සඳහා ජල සම්බන්ධතාවය ලබා දීම සඳහා මීටර් 300 දුර මාර්ගයේ කාණු කපා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08. තාක්ෂණික කමිටු සමාජිකයින් නම් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ප්‍රාදේශිය සභාවේ තාක්ෂණික කමිටු නිර්දේශ ලබා දීම සඳහා තාක්ෂණ කමිටුවක් පත් කල යුතුව පවතින බැවින් ඊට අදාලව පහත සඳහන් සංයුතියෙන් කමිටුවක් පත් කිරීම සුදුසු බවට වූ යෝජනාව සභාවට ඉදිරිපත් යෝජනා කරන ලදී.

01. කමිටු සභාපති ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා
02. කමිටු සමාජික ප්‍රසම්පාදන විෂය භාර නිළධාරී එස්.බී.ජේ.පී කුමාරදාස මිය
03. කමිටු සමාජික අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධ දැනුම ඇති පුද්ගලයෙකු (අවශ්‍යතාවය අනුව අදාල පුද්ගලයා වෙනස් වේ.)

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ප්‍රාදේශිය සභාවේ තාක්ෂණික කමිටු නිර්දේශ ලබා දීම සඳහා තාක්ෂණ කමිටුවක් පත් කල යුතු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් කල සංයුතියෙන් යුතුව තාක්ෂණ කමිටුව පත් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09. අපි එකමුතු අන්‍යෝන්‍යාධාර සමිති ශාලාව සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 237 තුලානේ උණගස්වැව ග්‍රාමයේ දෙවන පටුමගෙහි ඉදි කර ඇති ප්‍රජා ශාලාව සඳහා ජලය නොමැතිකම විශාල අඩුවක්ව පවතින් බවටත්, සාමාජිකයින් 75 කගෙන් පමණ සමන්විත මෙම සමිතියේ සියළුම පොදු කටයතු හා රැස්වීම් පැවැත්වීමට මෙම ශාලාව උපයෝගි කර ගන්නා බැවින් ඒ සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයේ නල ජල සම්බන්ධතාවයක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරමින් ජල සම්බන්ධතාවය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රජා ශාලාව සභාවට පවරා ගනිමින් ජල සම්බන්ධතාවය ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ප්‍රජා ශාලා මෙතෙක් සභාවට පවරා නැති බැවින් පැවරීමක් අවශ්‍ය නොවන අතර ප්‍රජාවගේ අවශ්‍යතාවයක් ඉටු කිරීම යටතේ අදාල ජල සම්බන්ධතාවය ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා මෙම ප්‍රජා ශාලාව සකස් කිරීමේදී සභා අරමුදලින් ජනතා ඉල්ලීම් ඉටු කිරිම යටතේ ලබා දුන් රු 50,000 ක මුදලින් රු 25,000 දැල් ආවරණය කිරීම සඳහා ලබා දුන් බවත්. එහි ඉතිරි ප්‍රමාණය ප්‍රජාවගේ දායකත්වයෙන් සිදු කර ගත් බවත්, මේ වන විට මේ අයුරින් සමිති ශාලාව සඳහා ජල සම්බන්ධතාවය ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බවත් සඳහන් කරමින් එය කඩිනමින් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 237 තුලානේ උණගස්වැව අපි එකමුතු අන්‍යෝන්‍යාධාර සමිති ශාලාව සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 ජුලි මස 09 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 ජුනි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2021 ජුනි මස ආදායම් වාර්තාවේ එකතු කල යුතු ආදායමේ ප්‍රතිශතයක් ලෙස යන තීරුවේ ප්‍රතිශතය නිවැරදිද යන්න විමසන ලද අතර 1312 - පාලම් සහ බෝක්කු අළුත්වැඩියාව වැය ශීර්ෂයේ මැයි මාසයේ ඇස්තමේන්තුව තුල රු 440,000 ක් ලෙස දක්වා ඇති අතර ජුනි මාසයේදී එය රු 100,000 දක්වා අඩු වී ඇති බැවින් එසේ සිදු වූවේ මන්ද යන්නත්, මෙතෙක් වර්ෂයට අදාල අයවැය වාර්තාව නොලැබීම තුල නිවැරදි සංඛ්‍යාව තහවුරු කර ගැනීමේ හැකියාව නැති වී ඇති බවත්, ප්‍රකාශ කරමින් අදාල ගැටළු වලට පිළිතුරු සාකච්ඡා කිරීම වෙනුවෙන් මහ සභාව කාරක සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලද අතර ඒ අනුව මහ සභාව කාරක සභාව බවට පත් විය.

ආදායම් වියදම් වාර්තා සම්බන්ධයෙන් විශාල සාකච්ඡාවකින් අනතුරුව කාරක සභාව මහ සභාව බවට පත් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා යෝජනා කල අතර ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව කාරක සභාව මහ සභාව බවට පත් විය. එහිදී ගරු සභාපතිතුමා ආදායම් වාර්තාවේ එකතු කල යුතු ආදායමේ ප්‍රතිශතයක් ලෙස යන තීරුවේ ප්‍රතිශතය සම්බන්ධයෙන්, යොමු කර ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් නිවැරදි සොයා බැලීමක් ඉදිරියේදී සිදු කරන බවටත්, 1312 - පාලම් සහ බෝක්කු අළුත්වැඩියාව වැය ශීර්ෂයේ මැයි මාසයේ ඇස්තමේන්තුව තුල රු 440,000 ක් ලෙස දක්වා ඇතත් ජුනි මාසයේදී එය රු 100,000 දක්වා අඩු වී ඇත්තේ 1304 වැය ශීර්ෂය සමඟ සිදු කල වැය මාරුවක් හේතුවෙන් බව සඳහන් කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විජයපුර සේනානායක මාවත ස්ථාපිත කර ඇති විදුලි සංදේශ කුළුණ ඉදි කිරීමට අදාලව සභා අනුමැතියක් ලබා දී ඇත්ද යන්නත්, එයට අදාලව ගෙවිය යුතු ගාස්තු මාසිකව හෝ වාර්ෂිකව සභාවට හිමි වන්නේද යන්න විමසන ලද අතර එසේ ගෙවීමක් සිදු නොකරන්නේ නම් ඒ කෙරේ අවධානය යොමු කර වාර්ෂිකව හෝ බද්දක් අය කරන ලෙසත්, රට තුල ගෝ ඝාතකාගාර තහනම් කිරීම සඳහා රජය විසින් තීරණයක් ගෙන ඇති අවස්ථාවක එම දැනුවත් කිරීම සභාවට ඉදිරිපත් කර ඇත්ද යන්නත්, විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා විදුලි සංදේශ කුළුණ ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේදී එකවර ගාස්තුවක් පමණක් ගෙවා ඇති බවත්, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදී බද්දක් ලබා ගැනීමේ හැකියාව පවතින්නේ ද යන්න ඉදිරියේදී පරික්ෂා කරන බවත්, මෙ වන තෙක් ගව ඝාතනය සම්බන්ධයෙන් සභාව දැනුවත් කිරීමට දන්වා නොමැති බවත්, සඳහන් කරන ලදි.

නැවතත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා නෙළුබැව පොල භූමිය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලබන බවට කරනු ලැබූ ප්‍රකාශය තුල වැසි කාලයත් සමඟ ජලය අදාල භූමියට ඒම සම්බන්ධයෙන් හා අදාල භූමිය ඉදිරිපිට පන්සල පවතින බැවින් කොම්පෝස්ට් ව්‍යාපෘතියකින් එන දුගඳ ද ගැටළුවක් වීමට ඇති හැකියාව වැඩි බැවින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා වෙනත් සුදුසු භූමියක් තොරා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

තවද කීරික්කුලම කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පසුගිය දිනවල පත් කල කමිටුවේ මේ වන විට ප්‍රගතිය කුමක්ද යන්නත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2021 හරහා 5 ඇල ශ්‍රාවස්තිපුර නිදන්ගල මාර්ගය

මීටර් 700 ක් අළුත්වැඩියා කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මේ වන විටත් ආරම්භ කර නොමැති බැවින් එයට හේතුව කුමක්ද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කොම්පොස්ට් ව්‍යාපෘතිය මෙම භූමිය තුල ක්‍රියාත්මක කරන බවට මෙතෙක් ලිඛිතව දන්වා නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී අනිවාර්යයෙන්ම සලකා බලන බවත් සඳහන් කරන ලදී.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2021 වැඩසටහන යටතේ කොට්ඨාශ කිහිපයකට පමණක් ව්‍යාපෘතිය හිමි වී තිබූ බැවින් අනෙකුත් කොට්ඨාශ සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් රු 500,000 වටිනාකමකින් යුතු ව්‍යාපෘති ලබා දෙන බවට ප්‍රකාශ කල හෙයින් 5 ඇල ශ්‍රාවස්තිපුර නිදන්ගල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තාවකාලිකව නතර කල බවත්, 500,000 බැගින් වූ ව්‍යාපෘති අනුමත වී පැමිණි පසු නැවත නිදන්ගල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන බවත් සඳහන් කරන ලදී.

තවද කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පත් කල කමිටු රැස්වීමට ප්‍රථම පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා zoom තාක්ෂණය ඔස්සේ වැඩසටහනක් පවත්වා ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරුන් සමඟ කල සාකච්ඡාවේදී, තමා විසින් මෙම කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කර පවත්වාගෙන ගිය බවටත්, අනතුරුව ප්‍රාදේශීය සභාවේ පැවති අපහසුතා නිසා ව්‍යාපෘතිය නගර සභාවට ලබා දුන් බවටත්, එහිදී ප්‍රාදේශිය සභාව අනියම් පදනමින් ව්‍යාපෘතිය සඳහා බඳවා ගත් සේවකයින් ස්ථිර කර ව්‍යාපෘතිය කරගෙන ගිය බවටත්, ප්‍රකාශ කරමින් සභාවට වූ අසාධාරණය සඳහන් කිරීමේදී අමාත්‍යතුමා අනිවාර්යයෙන්ම නැ.නු.ප ප්‍රාදේශිය සභාවට සාධාරණය ඉටු කරන බවට සඳහන් කල බවත්, එහිදී නගර සභාව, නැ.නු.ප ප්‍රාදේශිය සභාව හා තවත් ප්‍රාදේශීය සභාවක් ඒකාබද්ධ කර " කෞෂිමා " යන්ත්‍රයක් ස්ථාපිත කිරීමේ අදහසක් පවතින බවටත් එය අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ලාභාංශ ආයතන 03 ටම බෙදීමට අපේක්ෂාවෙන් සිටින බවටත්, මෙය ස්ථිර නොවන බවත්, එසේ වීමට බොහෝ දුරට ඉඩකඩ පවතීවී යන්නත් ප්‍රකාශ කරන ලදී.

තවද මාර්ග සංවර්ධනයේදී කොන්ක්‍රීට් කරනවාට වඩා කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම සිදු කිරීම ඵලදායී වන බවත්, ABC අතුරා කුට්ටි ගල් ඇතිරීම සිදු වන බැවින් එය හොඳ ප්‍රමිතියකින් යුතු වන බවත්, දැනට පළල මීටර් 03 ක් ලෙස දක්වා ඇතත් එය මීටර් 04 දක්වා වැඩි කර ගැනීමේ හැකියාවක් පවතීද යන්න විමසා බලන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදි.

අනතුරුව බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රිතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2021.07.20 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.05 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.08.20 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| .................................... | .......................................... |
| බී.එච් ප්‍රදීප් නිශාන්ත | එස්.බී කුමාරදාස මැතිතුමා |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |